## 364 සෙවනැලි මත

සෙවනැලි මත සෙවනැලි මත සෙවනැලි එන්නේ
ගඟ ගල ගල ගඟ ගල ගල පාවෙනු වැන්නේ
ඉහළට ගත් සුසුමට එන දුක කකියන්නේ
පෙර සුසුමෙන් ආ දුකටයි නැත නවතින්නේ

ජීවිතයට රස කැව්වා ආදර බස් කිව්වා
මළවුන් නැඟිටෙව්වා සත සෙත සැලසෙව්වා
ගිය තැන ගුණ වැව්වා පාපෙට ණය ගෙව්වා
ඉරණම ඔහු සෙව්වා මොහු මරවයි ලිව්වා

කඳු ගැටයක් සෙව්වා එය නඟිමියි කිව්වා
කුරුසයකට යැව්වා වැටි වැටි මඟ ගෙව්වා
දස දුක රස කැව්වා දෑතට ගෙන බිව්වා
කුරුසේ සැතැපෙව්වා මට පින් පැමිණෙව්වා